**ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 249-8100 ● ෆැක්ස්: +94 (11) 244-9070
විද්‍යුත් තැපැල: VanHornNT@state.gov ●වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20201217

## මිලෙනියම් චැලෙන්ජ් කෝපරේෂන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය සම්බන්ධයෙන් ප්‍රකාශය

**2020 දෙසැම්බර් 17වැනි දින, කොළඹ දී:** හවුල්කාර රටේ සම්බන්ධවීම අඩුබව හේතුකොටගෙන, ශ්‍රී ලංකාවට ලබාදීම සඳහා යෝජනා වී තිබුණු රු. බිලියන 89ක එම්සීසී සංවර්ධන ආධාර ප්‍රදානය නැවැත්වීමට මිලෙනියම් චැලෙන්ජ් කෝපරේෂන් (එම්සීසී) අධ්‍යක්ෂ මණ්ඩලය දෙසැම්බර් 15වැනි දින තීරණය කරන ලදී. ශ්‍රී ලංකාව සඳහා අනුමතව තිබූ එම රු. බිලියන 89ක මුදල, තමන්ගේ සංවර්ධන ප්‍රමුඛතා හඹා යාමට, දුගීබව අඩුකරගැනීමට, සහ තම ආර්ථික වර්ධනය කරගැනීමට මුදල් ප්‍රදාන අවශ්‍ය කර තිබෙන, සුදුසුකම් සහිත වෙනත් රටවල්වලට ලබාගත හැකිවනු ඇත.

අදාළ රට පිළිබිඹු කරන හිමිකාරත්වය, විනිවිදභාවය, සහ ප්‍රදානයේ ප්‍රතිඵල සඳහා වගවීම යන කරුණු, එම්සීසී හි සංවර්ධන ආකෘතිය තුළ ඉතාමත් වැදගත් වේ. එකතුව ඩොලර් බිලියන 13.5කට ආසන්න මුදල් ප්‍රමාණයක් සඳහා ලොව වටා රටවල් 30කට ආසන්න ප්‍රමාණයක සමගින් එම්සීසී විසින් සාර්ථක ප්‍රදාන ගිවිසුම් 38ක් ඇතිකරගෙන තිබේ. ප්‍රාදේශීය සහ දේශීය ආයෝජනය සඳහා හේතුකාරක වෙමින්, මෙම ප්‍රදාන ඔස්සේ පුද්ගලයින් මිලියන ගණනක් දුගීබවින් ඉහළට ඔසවා තබා ඇත.

එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ මිතුරකු සහ හවුල්කරුවකු ලෙස කටයුතු කරන අතර කෝවිඩ් සඳහා ප්‍රතිචාර දැක්වීමේදී සහ ස්වකීය ආර්ථිකය ගොඩනංවාගැනීමේදී ඉදිරියටත් අඛණ්ඩව ශ්‍රී ලංකාවට සහය ලබාදෙනු ඇත.